# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
# දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
# දැන්වීමයි

කැලණිය විශ්වවිද්‍යලයේ දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය මගින් පවත්වන ලද ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණයෙන් (2015) සමත්ව උපාධිය සම්පූර්ණ කරන ලද, 2022 සැප්තැම්බර් මස 26 වන දින පළකරන ලද උපාධිලාභී නාම ලේඛනයේ නම් සඳහන් විද්‍යාර්ථීන් හට උපාධිය සමත් වීම පිළිබඳ සවිස්තරාත්මක සහතිකය (Academic Record) මුදල් ගෙවීමකින් තොරව **<u>2022 ඔක්තෝම්බර් මස 04</u>** දින සිට දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයට පැමිණ ලබා ගත හැක. මේ සඳහා අදාළ විද්‍යාර්ථියාම පැමිණිය යුතු බව දන්වමි.

එසේම ඉහත විද්‍යාර්ථීන් වෙනුවෙන් ඉදිරියේ දී පැවැත්වීමට නියමිත උපාධි ප්‍රදානෝත්සවයට අදාළ අයදුම්පත් 2022 සැප්තැම්බර් 29 දින සිට අපගේ වෙබ් අඩවියට (www.cdce.kln.ac.lk) පිවිස බාගත කරගත හැකි අතර එසේ බාගත කරගත් අයදුම්පත නිසිලෙස සම්පූර්ණ කර අදාල මුදල් ගෙවන ලද ගෙවීම් වවුචරය සමග උපදෙස් පත්‍රිකාවේ සඳහන් අනෙකුත් අවශ්‍යතා ද සමගින් 2022 ඔක්තෝබර් මස 15 දිනට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලෙස දන්වමි.

**ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,**
**දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය,**
**නො. 56/6, කෝන්ගහවත්ත පාර,**
**නුවරපාර,**
**කිරිබත්ගොඩ.**

මෙම උපාධිලාභීන් සඳහා උපාධි ප්‍රදානෝත්සවය 2022 දෙසැම්බර් මස සිට ඉදිරියට පැවැත්වීමට කටයුතු සිදුකරනු ඇත.

එසේම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණයේ - 2016 සන්නිවේදනය සඳහා ඉංග්‍රීසි (ELTU) සහ පරිගණක සාක්ෂරතාවය (COMP) යන විෂයයන් සමත්ව උපාධිය සම්පූර්ණ කරන ලද විද්‍යාර්ථීන්ගේ නාමලේඛනය ඉදිරියේ දී නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකෙරෙමින් පවතින බවද වැඩිදුරටත් දන්වමි.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
කැලණිය විශ්වවිද්‍යාලය
2022.09.26